චක්‍රලේඛ අංක : 08 /2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,ජන ජය සිටි ගොඩනැගිල්ල.
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.11. 07

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

**<u>සමූපකාර සමිති වල වැඩබැලීම් හා රාජකාරි ඉටුකිරීමේ පත්කිරීම්</u>**

සමූපකාර සමිති වල , සාමාන්‍යාධිකාරී,ගණකාධිකාරී , ප්‍රධාන අභ්‍යන්තර විගණක , අභ්‍යන්තර විගණක හා අනෙකුත් විගණනය හා සම්බන්ධ තනතුරු වලට රාජකාරි ඉටුකිරීමේ පදනම මත අඩු සුදුසුකම් සහිත නිළධාරීන් යෙදවීම මඟින් සමිති අභ්‍යන්තරයේ විවිධ ගැටළුකාරි තත්වයන් පැන නැඟී ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

02. එම නිසා මින් ඉදිරියේදී ඉහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් වැඩබැලීම හෝ රාජකාරි ඉටුකිරීම හෝ සඳහා අනුමැතිය ඉල්ලීමේදී පහත පරිදි කටයුතු කිරීම අනිවාර්ය කෙරේ

I. අදාල සේවකයන්ගේ ජීවදත්ත තොරතුරු පත්‍රයක් සමඟින් ඉල්ලුම් කල යුතු වේ

ii. විගණනය සම්බන්ධ සියළු තනතුරු වලට කෙරෙන වැඩබැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ පත්කිරීම් අනිවාර්යයෙන් පූර්ණකාලීන විය යුතු වේ.

iii. කුමන තනතුරක් සම්බන්ධයෙන් වුවද වැඩබැලීම හෝ රාජකාරි ඉටුකිරීම හෝ සඳහා අනුමැතිය ඉල්ලීමේදී එම පත්වීම නිත්‍ය තනතුරට අතිරේකවද නොඑසේ නම් පූර්ණකාලීනවද යන්න අධ්‍යක්ෂ මණ්ඩල / කරක සභා තීරණයේ පැහැදිලිව සඳහන් කල යුතු වේ.

iv. ගණකාධිකාරී තනතුර මූල්‍ය කටයුතු පිළිබඳ තනතුරක් බැවින් එම තනතුරේ රාජකාරි කරනු ලැබූ අයෙකු අවම වශයෙන් ඉන් වසරක කාලයක් ගතවන තුරු එම සමිතියේම විගණනය හා සම්බන්ධ තනතුරකට පත් නොකල යුතු වේ. (එසේ වුවහොත් තමන් ගණකාධිකාරී ලෙස කල කටයුතු තමන්ටම විගණනය කිරීමට හැකිවීම නිසා අදාල සේවාව නිසි පරිදි ඉටු නොවන හෙයින්)

.03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2023.11.15 සිට ක්‍රියාත්මක වන අතර 06/2023 චක්‍රලේඛය එදින සිට අවලංගු කෙරේ.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ.
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. ) - කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.